www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# සසප ජනාධිපති අපේක්ෂක කොළඹ මැතිවරන රැස්වීම අමතයි

## Sri Lankan SEP presidential candidate to address Colombo election meeting

**2005 සැප්තැම්බර් 29**

නොවැම්බර් 17 දා පැවැත්වෙන ශ්‍රී ලංකා ජනාධිපතිවරනයේ සමාජවාදී සමානතා පක්ෂයේ (සසප) අපේක්ෂක විජේ ඩයස් ඊලඟ සතියේ පැවැත්වෙන සසප මැතිවරන උද්ඝෝෂනයේ ප්‍රථම ප්‍රසිද්ධ රැස්වීම අමතනු ඇත. ඔහු සසප ප්‍රධාන ලේකම් සහ *ලෝක සමාජවාදී වෙබ් අඩවියේ* ජාත්‍යන්තර කර්තෘ මන්ඩලයේ සාමාජිකයෙකි.

සසප මැතිවරනයට තරඟ වදින්නේ වැඩ කරන ජනතාවට සමාජවාදී විකල්පයක් ඉදිරිපත් කරනු පිනිස ය. එක්සත් ජාතික පක්ෂය සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය යන දෙගොල්ල ම වත්මන් ආර්ථික හා සමාජ ව්‍යසනය -- ජීවන මට්ටම් පිරිහීම ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට එරෙහි ප්‍රහාර සහ රට යලි සිවිල් යුද්ධය කරා ඇද වැටීමේ අන්තරාය -- සඳහා වගකිව යුතු ය. කම්කරුවන්ට සිය පන්ති අවශ්‍යතා සඳහා සටන් වැදිය හැක්කේ ධනේශ්වරයේ සියලු පක්ෂවලින් ස්වාධීනව බලගතු දේශපාලන ව්‍යාපාරයක් ගොඩනැගීමෙන් පමනක් යැයි සසප අවධාරනය කර සිටී.

සසප මැතිවරන උද්ඝෝෂනය මෙම කුඩා දිවයිනට සීමා නොවනු ඇත. එය දකුනු ආසියාව පුරා හා ජාත්‍යන්තරව වැඩ කරන ජනතාව අමතනු ඇත. එහි වැඩපිලිවෙල පදනම් වන්නේ. ශ්‍රී ලංකාවේ සිංහල, දෙමල හා මුස්ලිම් වැඩ කරන ජනතාව කලාපයේ වෙසෙන සිය පන්ති සහෝදරයන් සමග ඒකාබද්ධ කිරීම මත ය. දකුනු ආසියාවේ සමාජවාදී සමූහාන්ඩු සංගමයක කොටසක් ලෙස ශ්‍රී ලංකා-ඊලම් එක්සත් සමාජවාදී සමූහාන්ඩුවක් ගොඩනගනු පිනිස සසප සටන් වදී.

සසප දිවයින පුරා මෙන් ම ඉන්දියාව තුලත් රැස්වීම් මාලාවක් පැවැත්වීමට සැලසුම් කරයි. මෙම අභිලාෂාත්මක උද්ඝෝෂනය ගොඩනගනු පිනිස දියත් කර ඇති අපගේ රු. 500,000 විශේෂ අරමුදලට නොමසුරුව ආධාර කරන ලෙස අපගේ පාඨකයන්ගෙන් හා ආධාරකරුවන්ගෙන් අපි ඉල්ලා සිටිමු.

ඔබගේ ආධාර මුදල් සමාජවාදී සමානතා පක්ෂයේ ගිනුමට එවිය හැකි ය

ගිනුම් අංකය: 1472834301
කොමර්ෂල් බැංකුව
කිරුලපන ශාඛාව 94ඒ පාමංකඩ පාර කිරුලපන

### කොලඹ

**මහජන පුස්තකාල ශ්‍රවනාගාරය**
**ඔක්තෝබර් 4 දා සවස 4.00**

### හලාවත

**ෂර්ලි කොරයා අනුස්මරන ශාලාව**
**ඔක්තෝබර් 14 දා සවස 3.00**

### කුරුනෑගල

**මහජන පුස්තකාල ශ්‍රවනාගාරය**
**ඔක්තෝබර් 29 සවස 3.00**

© www.wsws.org